**ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රීලංමබැ) -2013**

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 42(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීමේදී ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලවීම පරික්ෂා කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගමක් මට සහාය විය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානු සාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් ව්‍යාපෘති සම්පූර්ණ කර තිබූ නමුත් එම ව්‍යාපෘති වියදම් පිළිබඳ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

| වියදම් විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| පළාත් කාර්යාල නවීකරණය කිරීම | 3,258,939 |
| ගිනි ආරක්ෂණ පද්ධති | 5,364,072 |
| ආදර්ශ ගොවිපොළ | 2,404,830 |
| මධ්‍යම ස්ථාන ගොඩනැගිල්ල | 409,000,000 |
| වයිට් අවේස් (white Aways) ගොඩනැගිල්ල | 400,000,000 |

**2.2.2 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1949 අංක 58 දරන මුදල් නීති පනත | |
| (i) 39 වගන්තිය | ශ්‍රී ලංකා මහ බැංකුව උපයන ලද ලාභ විසර්ජනයෙන් පසු හා ශ්‍රී ලංකා රජයෙන් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුව උපයන ලද ලාභය මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මහා භාණ්ඩාගාරයට මාරු කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් අත්තිකාරම් ගෙවීම් ලෙස 2013 වර්ෂයේ අවස්ථා 7 කදී රු.බිලියන 25 ක මුදලක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණු අතර තවත් රු.බිලියන 3 ක මුදලක් පනතේ විධිවිධානයන්ට පටහැනිව ඉතිරිවූ ලාභයක් ලෙස රඳවාගත් ඉපැයුම් වලින් රජයට මාරු කර තිබුණි. තවද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මත පදනම්ව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට |

| | | |
|---|---|---|
| | | අනුව, රු.බිලියන 24.26 ක පාඩුවක් විය. එසේ වුවද, රු.මිලියන 26.758 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය හා රු.බිලියන 27.892 ක විදේශ වත්කම් මත "Marked - to - Market " පාඩුව සැලකිල්ලට ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බෙදාහැරිය යුතු ලාභය ගණනය කර තිබුණි. |
| (ii) | 39(ආ) වගන්තියට සංශෝධනය | මුළු වත්කම් සහ රන් හා විදේශ මුදල්හි වත්කම් අතර වෙනස ප්‍රතිශතයක් ලෙස මුළු කොටස් හිමිකරුවන්ගේ ස්කන්ධයෙන් සියයට සියයක ප්‍රමාණයට වඩා අඩු නොවිය යුතුය. කෙසේ වුවද මෙම සියයට සියයේ අවශ්‍යතාවයට එරෙහිව සමාලෝචිත වර්ෂය එක දිගට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන ගොස් තිබූ අනුපාතය සියයට 44 සිට සියයට 76 දක්වා විය. ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා විසින් "මුදල් නීති පනතේ දක්වා ඇති සියයට 15 ක අනුපාතයට අමතරව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අභ්‍යන්තර නියාමනය සඳහා ස්වේච්ඡා මිනුම්දඬු (Bench Marks) ලෙස මුදල් මණ්ඩලය විසින් වරින්වර ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාත තීරණය කරනු ලැබේ. කෙසේ වුවද 2014 රජයේ අයවැය මඟින් යෝජනා කරන ලද පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාග්ධනය රු.බිලියන 50 දක්වා වැඩි කිරීමත් සමඟ ඉහත දක්වා ඇති ස්වේච්ඡා අනුපාතය අවලංගු කිරීමට හා විචක්ෂණතාවයෙන් යුත් පදනම මත ඇතිවන නව තත්ත්වයන් හේතුවෙන් අතිරේකව ප්‍රාග්ධනය අවශ්‍ය වේ නම් එක් එක් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමේ අවස්ථාවේදී වාර්ෂිකව එවැනි අනුපාතයක් නියම කිරීමට මුදල් මණ්ඩලය තීරණය කරන ලදි " යන්න මා වෙත දන්වා තිබුණි. |
| (ආ) | 1997 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත සහ 2012 ජූලි 06 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දෙනු ලැබූ නියෝගය | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපයන විට ගෙවීම් බදු පනතට හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදෙස්වලට පටහැනිව එහි සේවකයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ අරමුදල්වලින් පිළිවෙලින් එකතුව රු.මිලියන 178.1 ක් හා රු.මිලියන 138.9 ක් උපයන විට ගෙවීම් බදු ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 24,265 ක ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.මිලියන 66,209 ක ශුද්ධ ලාභයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 41,944 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයේ රු.මිලියන 25,182 ක් වූ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 26,759 ක පාඩුවක් වී තිබීම සහ ඉකුත් වර්ෂයේ රු.මිලියන 24,866 ක් හා රු.මිලියන 30,608 ක් වූ පිළිවෙලින් දේශීය විනිමය මූල්‍ය වත්කම් සහ විදේශ විනිමය මූල්‍ය වත්කම් වලින් වූ ශුද්ධ ලාභය සමඟ සැසඳීමේදී සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දේශීය විනිමය මූල්‍ය වත්කම් හා විදේශ විනිමය මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ආදායම පිළිවෙලින් රු.මිලියන 11,470 ක් සහ රු.මිලියන 4,002 ක් වීම සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයේ අඩුවීමට හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ රු.බිලියන 26.8 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව ඇතුළත්ව මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / ( වියදම ) රු.බිලියන 12.8 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ රු.බිලියන 25.2 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය ඇතුළත්ව රු.බිලියන 75.9 ක් වූ හෙයින් මුළු ශුද්ධ මෙහෙයුම් ආදායමේ සියයට 117 ක අඩුවීමක් නිරූපනය විය. එහෙත් ඉකුත් වර්ෂයේ ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් ද ඇතුළත් රු.බිලියන 7.1 ක මෙහෙයුම් වියදම සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී එය රු. බිලියන 9.4 ක් වූයෙන් එහි සියයට 32 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආදායම හා වියදම පිළිබඳ වෙනස්වීම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2013 | 2012 | වෙනස හිතකර / (අහිතකර) | |
|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | ප්‍රතිශතය |
| විදේශ මූල්‍ය වත්කම්වලින් ආදායම | 4.0 | 30.6 | (26.6) | 87 |
| විදේශ මූල්‍ය වගකීම් මත වියදම් | 4.4 | 5.7 | 1.3 | 23 |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය / (පාඩුව) | (26.7) | 25.1 | (51.8) | 206 |
| දේශීය මූල්‍ය වත්කම්වලින් ආදායම | 11.5 | 24.8 | (13.3) | 54 |
| මෙහෙයුම් වියදම | 9.4 | 7.1 | (2.3) | 32 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ (පාඩුව) | (24.2) | 66.2 | (90.4) | 136 |

**3.3 මෙහෙයුම් සමාලෝචනය**

**3.3.1 ශ්‍රී ලංකා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා වූ ක්‍රියාකාරකම්**

**(අ) අසාර්ථක මූල්‍ය සමාගම් පිළිබඳ අධීක්ෂණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1988 - 1994 කාල පරිච්ඡේදය තුළදී අසාර්ථක මූල්‍ය සමාගම් 6 කට ලබාදී තිබූ රු.බිලියන 6.1 ක් වූ හිඟ ණය සහ ප්‍රතිමූල්‍ය පහසුකම් ලියා හැරීමට මුදල් මණ්ඩලය

විසින් 2011 මාර්තු 21 දින අනුමැතිය ලබාදී තිබුණි. පසුව, ඈවර කරමින් තිබුණු එම මූල්‍ය සමාගම් 6 හි ඈවර කිරීම් මුදල් වලින් එය ඉල්ලුම් කිරීමට 2011 සැප්තැම්බර් 01 දින මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. එම තීරණයෙන් පසු රු.මිලියන 317.1 ක් වූ මුළු ඈවර කිරීම් මුදල්වලින් 2014 සැප්තැම්බර් අවසානය දක්වා රු.මිලියන 18.4 ක මුදලක් පමණක් ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබී තිබුණි.

(ii) රු.බිලියන 3.5 ක් වූ තැන්පත්කරුවන් සඳහා වගකීම් ඇති මූල්‍ය සමාගමක් 2013 වර්ෂයේදී බුන්වත්වී තිබූ අතර මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්මට එය අවශෝෂණය කරන ලදි.

**3.3.2 මුදල් කළමනාකරණය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමහර සමරු කාසි තොග සංචලනය ඉතා සෙමින් සිදුවන බව නිරීක්ෂණය වූ අතර ඉන් පෙනී යන්නේ ඒ සඳහා මහජන ඉල්ලුම ඉතා පහළ මට්ටමක පවතින බවයි. 2013 දෙසැම්බර් 31 දිනට සුරක්ෂිතාගාරයේ පැවති එවැනි සමරු කාසිවල තොග තත්ත්වය පහත දැක්වේ.

| විස්තරය | නිකුත් කළ වර්ෂය | මුහුණත අගය | ටංකනය කළ කාසි ප්‍රමාණය | 2013 දෙසැම්බර් 31 දිනට සුරක්ෂිතාගාරයේ පැවති කාසි ප්‍රමාණය |
|---|---|---|---|---|
| | | රු. | රු. | |
| 2500 බුද්ධ ජයන්තිය | 1957 | 5 | 500,000 | 20,167 |
| ආර්.ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තියේ 3 වන සංවත්සරය | 1993 | 1 | 2,500 | 746 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 50 වන සංවත්සරය | 1995 | 5 | 5,000 | 3,948 |
| ශ්‍රී ලංකාවේ 50 වන නිදහස් සංවත්සරය | 1998 | 1,000 | 25,000 | 6,678 |
| ලෝක ක්‍රිකට් කුසලානය - 1996 | 1999 | 1,000 | 25,000 | 10,153 |
| 2550 බුද්ධ ජයන්තිය | 2006 | 2,000 | 10,000 | 8,416 |
| 2550 බුද්ධ ජයන්තිය | 2006 | 1,500 | 20,000 | 18,687 |
| ලෝක ක්‍රිකට් කුසලානය - 2007 | 2008 | 1,000 | 10,000 | 7,981 |

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් නෝට්ටු ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බියගම පිහිටි පුද්ගලික සමාගමක් විසින් මුද්‍රණය කර තිබුණි. එකී සමාගම විසින් මුද්‍රණය කරන ලද මුදල් නෝට්ටුවලින් රු.1000 හා රු.500 වටිනාකමින් යුත් අඩක් මුද්‍රණය කරන ලද නෝට්ටු 2835 ක් සමාගමේ සේවකයකු විසින් සොරකම් කර තිබුණු අතර එය 2014 ජූලි 02 දින පුවත්පත්වල පළ කර තිබුණි. තවද හානි වූ නෝට්ටු විනාශ කිරීම හා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමෙන් පසු මුද්‍රණ කඩදාසි ඉවත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් දෙපාර්තමේන්තුව හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුකර තිබුණි. කෙසේ වුවද 2013 මාර්තු 21 දිනෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම විනාශ කිරීම් අධීක්ෂණය කර නොතිබූ බව විගණනයේදී අනාවරණය විය. හානි වූ නෝට්ටුවල වටිනාකම රු.1,417,500 ක් විය.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

2013 දෙසැම්බර් 31 වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන් 18 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතනවලට මුදා හැර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරන ලද පිරිවැය රු.මිලියන 38.4 ක් විය. ඉන් රු.මිලියන 13.6 ක මුදලක් පමණක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ වාහන හා මාණ්ඩලික නිලධාරින්ගේ වාහන සඳහා වාහන ගාල් කිරීමේ ඉඩමක් ලෙස භාවිතා කිරීමට 2000 ජුනි 02 දින සිට බලපැවැත්වෙන පරිදි, වර්ෂ 99 ක කාලයක් සඳහා රු.100,485,000 ක් වැය කරමින් පර්චස් 133.98 ක ප්‍රමාණයක් වූ "ට්‍රාන්ස්වර්ක්ස් චතුරශ්‍ර ඉඩම " පිළිබඳ කල් බදු අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්පත් කර ගෙන තිබුණි. පසුව විදේශ ආයෝජකයකු සමඟ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2000 වර්ෂයේදී අත්සන් කරන ලද කල් බදු ගිවිසුම අවලංගු කිරීමෙන් තොරව නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් එම ඉඩම් කොටස නැවත අයත් කර ගන්නා ලදි. තවද කල් බදු ප්‍රතිශ්‍රැාව නිරවුල් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ නව ගිවිසුමකට එළඹ නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට කල් බදු ඉඩමේ පොත් අගය රු.88,558,750 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇස්තමේන්තුව අනුව, ඉඩමේ වෙළඳපොළ අගය රු.මිලියන 1,200 ක් පමණ විය. කලින් ගෙවන ලද කල් බදු වාරිකය නාගරික සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිහි කැඳවීම් කිහිපයක් යැවීම හැර විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2012 වර්ෂයේදී කොළඹ 01 , බාරොන් ජයතිලක මාවතේ ගොඩනැගිල්ලක් (වයිට් අවේස් ගොඩනැගිල්ල ) රජයේ තක්සේරුකරු විසින් කරන ලද තක්සේරුව මත රු.මිලියන 500 කට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් මිලදී ගෙන තිබූ අතර රු.මිලියන 75.7 ක මුදලක් ගොඩනැගිල්ලේ අළුත් වැඩියාව සඳහා වැයකර තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ තීරණයට අනුව, මෙම ගොඩනැගිල්ල අත්කර ගැනීමේ දිගු කාලීන අරමුණ වූයේ අවදානම් කළමනාකරණ පියවරක් ලෙස වෙනම ස්ථානයක අතිරේක පරිශ්‍රයක් තබාගැනීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු කිහිපයක මධ්‍ය කාලීන හා දිගු කාලීන ව්‍යාප්ත කිරීමේ පහසුකම් ඇති කර ගැනීමයි. එසේ වුවද, ප්‍රධාන ගොඩනැගිලි පරිශ්‍රය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවට අතිරේක ගොඩනැගිලි පහසුකම් තිබීමත්, එමෙන්ම දැනටමත් අත්කර ගෙන ඇති වෙනම ගොඩනැගිලි දෙකක් තිබීමත් හේතුවෙන් අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන් ගැනීමේ අරමුණ සඳහා තවත් ගොඩනැගිල්ලක් අත්කර ගැනීම ප්‍රශ්නගත කරුණක් වේ.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එජඩො 6,207,116 ක් (රු.607,121,953 ක් ) වැය කරමින් නිව්යෝක් හි ගොඩනැගිල්ලක් 2011 අගෝස්තු 24 දින අත්කර ගෙන තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව එම ගොඩනැගිල්ල 2012 ජුනි 01 දින සිට වර්ෂ 3 ක කාල පරිච්ඡේදයක් සඳහා එජඩො 68,000 ක මාසික කුලියකට විදේශ කටයුතු අමාත්‍යාංශයට කුලියට දී තිබුණි. තවද මුදල් නීති පනතේ 117 වගන්තියෙහි "ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යම් හිමිකමක් පිළිබඳ තෘප්ත වීමේදී යම් ආකාරයකින් අත්කර ගත හැකි එවැනි අයිතියක් හැර වෙළඳාමක හෝ කිසිඳු වාණිජමය නිෂ්පාදනමය හෝ වෙනත් ව්‍යාපාරයක නොයෙදිය යුතුය. " යනුවෙන් දැක්වේ. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ

අධිපතිවරයා විසින් මා වෙත මෙසේ දන්වා තිබුණි. "ඇමෙරිකා එක්සත් ජනපදයේ දේපල වෙළඳපොළ අවපාතයට ලක්වී තිබෙන විට හා රටේ ආර්ථිකය ඉහළ මධ්‍යම ආදායම් වර්ගය දෙසට ගමන් ගන්නා බැවින් බැංකුවේ අනාගත මෙහෙයුම් සඳහා යොදා ගැනීමේ අදහසින් නිව්යෝක් දේපල මිලදී ගන්නා ලදි. ස්වකීය අරමුණු සඳහා මෙම ගොඩනැගිල්ල මහා බැංකුවට අවශ්‍ය වන අවස්ථාව දක්වා දේපල පිළිබඳ විධිමත් උපයෝජනය තහවුරු වන පරිදි ශ්‍රී ලංකා රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයට කුලියට දෙන ලදි. "

## 3.7 මතභේදයට තුඩුදෙන කරුණු

පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2013 මාර්තු 16 දින විදේශ සමාගමක් සමඟ වර්ෂ එකක කාල පරිච්ඡේදයක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි.

(අ) ශ්‍රී ලංකාවේ දිගු කාලීන දේශපාලනික හා ආර්ථික අභිලාෂයන් වැඩිදියුණු කිරීම සඳහා බොහෝ සෙයින් මඟපෙන්වන අමෙරිකා එක්සත් ජනපදයේ (USA) දේශපාලනික පරිසරය යොදා ගැනීමට.

(ආ) ශ්‍රී ලංකාවේ වර්තමාන සපුරා ගැනීම් හා අනාගත සැලසුම් සම්බන්ධයෙන් නිරවුල් හා නිවැරදි තොරතුරු පිළිබඳ ඇමරිකා එක්සත් ජනපදයේ තීරණ ගන්නන් සඳහා විස්තීරණ තොරතුරු වේදිකාවක් සැපයීමට, සහ

(ඇ) ඇමරිකා එක්සත් ජනපදයෙන් විශාල පරිමාණයේ පුද්ගලික අංශ ආයෝජනයක් ශ්‍රී ලංකාවට ගෙන ඒමට

ගිවිසුමට අනුව, වර්ෂය සඳහා එකඟවූ මුළු සේවා ගාස්තුව රු.මිලියන 100 ක් වූ අතර යම් අතිරේක සේවාවන් වේ නම් ඒ සඳහා වෙනම ගෙවිය යුතුය. ඉහත සේවා ගාස්තුවෙන් රු.මිලියන 77.4 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දක්වා ඉහත විදේශ සමාගමට ගෙවා තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකාවේ ජාතික අයිතීන් පිළිබඳ ප්‍රවර්ධනය, සැලසුම් හා ජාත්‍යන්තර ආරක්ෂාව ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව විදේශ කටයුතු අමාත්‍යාංශයේ වගකීම වේ. එබැවින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත කාර්යයන්වලට අනුගතවීම ශ්‍රී ලංකා මහා බැංකුවේ අරමුණුවලට පටහැනිය.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) විනිමය කළමනාකරණය
(ආ) බැංකු නොවන කටයුතු අධීක්ෂණය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) දේපල ගිණුම්කරණය